# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

**දුරකථන / ෆැක්ස් : 2556629  ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com  වෙබ් අඩවිය : www.slpia.lk**


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/159/20 ඔබේ අංකය :

2020.08.31

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම් සහ උසස්කිරීමේ පටිපාටිය (SOR) සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.</u>**

සහකාර පොලිස් අධිකාරී තනතුරට බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියට අනුව (SOR) සහකාර පොලිස් අධිකාරී තනතුරෙන් ඉහල නිලධරයන් විශ්‍රාම යාමේදී ඔවුන් ඊළඟ තනතුර සඳහා උසස්වීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබේනම් විශ්‍රාම යාමේදී ඊළඟ තනතුරට උසස් කිරීමට ප්‍රතිපාදන ඉහත අනුමත පටිපාටියේ ඇතුලත් කර ඇත.

එසේ වුවද, දැනට කෙටුම්පත් කර ඇති උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවා ගැනීම් සහ උසස් කිරීම් පරිපාටියට එවැනි ප්‍රතිපාදනයක් ඇතුලත් කර නොමැත. එබැවින් ඉහත පූර්වාදර්ශය අනුගමනය කරමින් සෙසු තනතුරු වල නිලධරයන් ද සේවයෙන් විශ්‍රාම ගැනීමට පෙර එම තනතුරේ සිට ඊලග තනතුරට උසස්වීම සඳහා අවශ්‍ය අවම සුදුසු කම් සපුරා තිබේනම්, එම නිලධරයන් ද විශ්‍රාම ගැනීමට පෙර ඊලග තනතුරට උසස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන උප පොලිස් පරීක්ෂක බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියට (SOR) ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතීඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතීඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය